# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/42 - 2017 දෙසැම්බර් මස 08 වැනි සිකුරාදා - 2017.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : සී. අයි./1814

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

එක් පාර්ශ්වයක් වශයෙන් ඔරුවල පිහිටා ඇති ලංකා සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් සහ අනෙක් පාර්ශ්වය වශයෙන් රාජගිරිය, සරණ මාවත, 4 වන මහල, 341/21 හි පිහිටා ඇති ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය හා පිටකෝට්ටේ, කෝට්ටේ පාර, නො. 416 හි පිහිටා ඇති ජාතික සේවක සංගමය අතර 2017 ජූනි මස 21 වන දින ඇති කරගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

2017 අංක 24 දරන සාමූහික ගිවිසුම

**සාමූහික ගිවිසුම**

මෙම සාමූහික ගිවිසුම සේවා යෝජක පක්ෂය වන අතුරුගිරිය ඔරුවල පිහිටි සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය හා සේවක පක්ෂය වන 341/21, 4 වන මහල, සරණ මාවත, රාජගිරිය ලිපිනයේ සඳහන් ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, නො. 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ ලිපිනය සඳහන් ජාතික සේවක සංගමය සමග අද දින ඇති කරගන්නා ලද අතර පහත සඳහන් එකඟතාවයන් 2017 අප්‍රේල් 01 දින සිට 2020 මාර්තු 31 දක්වා වසර 03 ක කාලයක් සඳහා බලාත්මක වන ලෙස පාර්ශ්වකරුවන් විසින් ගිවිස ගන්නා ලදී.

1. වැටුප් වැඩිවීම.

පළමු වර්ෂය එනම් 2017 අප්‍රේල් මස 01 දින සිට 2018 මාර්තු 31 දක්වා මාසිකව රුපියල් 1000.00 ක දීමනාවක් හා 2013 වසරේ සිට 2016 වසර දක්වා ක්‍රියාත්මක කරනු ලැබූ සාමූහික ගිවිසුමෙන් ලබා දුන් විශේෂ දීමනා මුදලින් රුපියල් 1500.00 මුදලක් මූලික වැටුපට එක් කොට ක්‍රියාත්මක කිරීමටද,

දෙවන වර්ෂය එනම් 2018 අප්‍රේල් 01 දින සිට 2019 මාර්තු 31 දක්වා මාසික රුපියල් 1000.00 ක දීමනාවක් ද,

තෙවන වර්ෂය එනම් 2019 අප්‍රේල් 01 දින සිට 2020 මාර්තු 31 දක්වා මාසික රුපියල් 500.00 ක දීමනාවක් ද,

ලෙසින් වසර 03 කට බල පැවැත්වෙන පරිදි සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයේ සියලුම ස්ථිර සේවකයින්ට ලබා දීමට එකඟ වන ලදී.

**2. සේවක උසස්වීම්.**

දෙපාර්තමේන්තු ප්‍රධානී අනුමැතිය මත සේවකයාගේ කුසලතාවය ඇගයීමට ලක් කොට උසස්වීම් ලබා දීමට එකඟ වන ලදී.

**3. කොන්ත්‍රාත් සේවකයින් ස්ථිර කිරීම.**

සේවකයින් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානී සේවා ඇගයීම, ආයතනයට ඇති අවශ්‍යතාවය, සේවකයාගේ කුසලතාවය, පැමිණීම හා විනය යන කරුණු පදනම් කරගෙන සකසනු ලබන ක්‍රමවේදයකට අනුව මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු වාර්ෂිකව කොන්ත්‍රාත් සේවකයින් 10 දෙනෙකු බැගින් ස්ථිර කිරීමට එකඟවන ලදී.

**4. නිල ඇඳුම.**

වසරකට එක් සේවකයෙකුට දැනට දෙනු ලබන ටී ෂර්ට් 03 ක් ලබා දීමට එකඟ වන ලදී. සේවකයන් විසින් ආයතනයෙන් ලබාදෙන ආරක්ෂක උපකරණ පැළඳීම කළ යුතු වේ.

**5. විනෝද චාරිකාව.**

වාර්ෂිකව ආයතනය විසින් සේවකයින්ට විනෝද චාරිකාවක් ලබා දීමට එකඟ වන ලදී.

**6. විපත් ණය මුදල්.**

දැනට පවතින ක්‍රමවේදය අනුව ලබා ගත් ණය මුදලේ 2/3 ක් ගෙවී අවසන් වූ පසු වැටුපෙන් 40% සීමාව සළකා බලා අවශ්‍ය සේවකයින් සඳහා මෙම දීමනාව ලබා දීමට එකඟ වන ලදී.

**7. වෘත්තීය සමිති ක්‍රියා මාර්ග.**

ගිවිසුම බලාත්මකව පවතින කාල සීමව තුළදී මෙම ගිවිසුම මෙන්ම මෙම ගිවිසුමෙන් ආවරණය වන්නාවූ කිසිම කරුණක් සම්බන්ධයෙන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට අවතීරණ නොවීමට වෘත්තීය සමිති හා සේවකයින් එකඟ වෙයි.

8. මෙම සාමූහික ගිවිසුම වලංගුව පවත්නා කාලය තුළ දී කිසියම් පාර්ශ්වයක් විසින් අන්‍යෝන්‍ය එකඟතාවයකින් හැර, සාමූහික ගිවිසුමේ කිසියම් කොන්දේසියක් හෝ කොන්දේසි මොනයම් අන්දමක හෝ වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීම සිදු කළ නොහැකි බවට එකඟ වේ.

9. සේව්‍ය/සේවකයින් සහ වෘත්තීය සමිති එකිනෙකා සමග සහයෝගය දක්වමින් දූෂණය නාස්තිය වලකාලමින් සමාගමේ නිරන්තර දියුණුවට සහ ආයතනයේ ඵලදායීතාවය වැඩි කිරීමට කැපවීමෙන් කණ්ඩායම් හැඟීමෙන් වැඩ කරන බවට වෘත්තීය සමිති සේවකයින් සමඟ එකඟ වේ.

10. වෘත්තීය සමිති සහ සේවකයින් තමන්ට නියම කර ඇති සේවා කටයුතු හොඳින් සිදු කිරීමට එකඟ වන අතර නිෂ්පාදන අංශයේ සේවකයින් නියමිත නිෂ්පාදන ඉලක්කයන් ලබා දීමට එකඟ වෙයි.

11. සමාගමේ සියලු උපකරණ සහ යන්ත්‍රසූත්‍ර දේපළ, ආයතනයේ කීර්ති නාමය ආරක්ෂා කිරීමට මෙන්ම ආයතනයේ නිශ්පාදන ක්‍රියාවලියේ හා වෙළඳ කටයුතු සම්බන්ධව කිසිදු කරුණක් හෙළිදරව් නොකිරීමට හා එහි රහස්‍යභාවය සුරැකීමට වෘත්තීය සමිති සහ සේවකයින් එක්ව හා වෙන් වෙන්ව එකඟ වේ.

ඉහත සඳහන් කරුණු අනුව කටයුතු කිරීමට එකඟ වෙමින් මෙකී පාර්ශ්වකරුවන් විසින් මෙයට සාක්ෂි ලෙස 2017.06.21 වන දින නාරාහේන්පිට කම්කරු දෙපාර්තමේන්තුවේ දී අත්සන් තබන ලදී.

ජී. බී. කරවිට
සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්
ආයතනය වෙනුවෙන්
මානව සම්පත් කළමනාකාර

ලෙස්ලි දේවේන්ද්‍ර
ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය
ප්‍රධාන ලේකම්

ඊ. ජේ. යූ. සමරසිංහ
සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්
ආයතනය වෙනුවෙන්
පරිපාලන සහකාර

සුරංග නාවුල්ලගේ
ජාතික සේවක සංගමය
ප්‍රධාන සංවිධායක

වජිරකාන්ත පෙරේරා
ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය
සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමටඩ්
ශාඛාවේ සභාපති

රත්නසිරි
ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය
සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමටඩ්
ශාඛාවේ ලේකම්

ජයනාත් දේවප්‍රිය පෙරේරා
ජාතික සේවක සංගමය
සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමටඩ්
ශාඛාවේ සභාපති

පියල් තලගල
ජාතික සේවක සංගමය
සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමටඩ්
ශාඛාවේ ලේකම්

12 - 768

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.